**අම්පාර නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 සැප්තැම්බර් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 නොවැම්බර් 19 දින ද විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 දෙසැම්බර් 04 දින ද සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට අම්පාර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වේ. | පිළිගනිමි. |

#### (ආ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සභාව විසින් භුක්ති විඳින ඉඩම් කැබලි 41 ක හා ගොඩනැගිලි 175 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |
| (ii) පළාත් පාලන අමාත්‍යාංශය මගින් ඉදිකර 2017 වර්ෂයේ සභාවට භාර දී තිබුණු රු.228,906,546 ක් වටිනා කඩකාමර 25 ක් සහිත අම්පාර බස් නැවතුම්පලෙහි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | සියලුම වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2019 වර්ෂයේ සහා අරමුදල් යටතේ ඉටුකරන ලද කර්මාන්ත 04 කට අදාල නිමි වැඩ වටිනාකම රු.1,092,950 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |
| (iv) | 2019 වර්ෂයේ පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සිදුකරන ලද සේනානායකපුර පුස්තකාලය නවීකරණය කර්මාන්තයට අදාල අලුතින් ඉදිකරන ලද නිමි වැඩ වටිනාකම රු.717,325 ක් වූ කාමරය හා වැසිකිළිය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |
| (v) | යුනොප්ස් ආයතනය විසින් ඉදිකර 2010 වර්ෂයේ සභාවට භාර දී තිබුණු රු.52,681,935 ක් වටිනා කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම් 03 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |
| (vi) | 2018 වර්ෂයේ දී අම්පාර සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය විසින් ඉදිකර සභාවට භාර දී තිබුණු නිමි වැඩ වටිනාකම රු.13,750,550 ක කොම්පෝස්ට් අංගනයේ මල අපද්‍රව්‍ය ප්‍රතිකර්ම ඒකකය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |
| (vii) | තානායම සඳහා මිලදීගෙන තිබුණු රු.139,723 ක් වටිනා කබඩ් 01 ක් හා කුඩ සහිත මේස 12 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (viii) | කායවර්ධන මධ්‍යස්ථානය සඳහා ලබාගත් රු.2,273,850 ක ව්‍යායාම උපකරණ රු.2,445,000 ක් ලෙස රු.171,150 ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ix) | 1996 සිට 2016 දක්වා කාල පරිච්ඡේදය තුල මිලදීගෙන/ පරිත්‍යාග වශයෙන් ලැබී ළමා උද්‍යාන 07 ක සවිකර තිබුණු ළමා ක්‍රීඩා උපකරණ 19 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (x) | නගර සභාව සතු රු.162,644,496 ක් වටිනා වාහන හා යන්ත්‍රෝපකරණ 49 ක හා වටිනාකම තක්සේරු නොකළ වාහන 04 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | සියලු වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (xi) සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.280,890 ක් වටිනා වාහන හා යන්ත්‍රෝපකරණ 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xii) සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.1,201,978 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ 26 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගනිමි. තව දුරටත් සොයා බලා ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xiii) 2016 හා 2018 වර්ෂ සඳහා ලැබිය යුතු රු.1,218,000 ක මුද්දර ගාස්තු ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xiv) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පළාත් සභාවෙන් ලැබිය යුතු කාර්යාල වැටුප්, මන්ත්‍රී දීමනා හා අභ්‍යාසලාභී උපාධිධාරී දීමනා රු.5,865,767 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xv) ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම් බිල්කිරීම් රු.2,348,209 ක් පොදු ලෙජරයේ රු.1,898,755 ක් ලෙස රු.449,454 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xvi) ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.3,239,971 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xvii) හිඟහිටි වෙනත් ආදායම් ගිණුමෙහි රු.3,420,000 ක හර සටහනක් හා රු.2,550,000 ක් බැර සටහනක් ව්‍යාජ ලෙස දක්වා ගිණුම් තුලනය කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xviii) ලේඛනය අනුව රු.2,847,000 ක් වූ සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම් බිල්කිරීම් පොදු ලෙජරයේ රු.2,489,000 ක් ලෙස රු.358,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xix) සභා අරමුදල් යටතේ ඉටුකරන ලද ඉදිකිරීම් කර්මාන්ත 02 ක් සඳහා ගෙවිය යුතු රු.313,250 ක් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (xx) පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ඉටුකරන ලද කර්මාන්ත 05 ක් සඳහා ගෙවිය යුතු රු.2,157,849 ක් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xxi) සමාලෝචිත වර්ෂයේ ඉටුකරන ලද කර්මාන්ත 08 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු රු.367,985 ක අත රඳවුම් මුදල් ගිණුම්ගත කර නොතිබුණි. | ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xxii) ඉදිකිරීම් කර්මාන්තවලට අදාල රු.3,413,832 ක තැන්පතු ලැබීම් හා රු.3,283,289 ක තැන්පතු ගෙවීම් ගිණුම්ගත කර නොතිබුණි. | සියලු තැන්පතු ලැබීම් හා ගෙවීම් ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xxiii) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු.576,263 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවිය යුතු වියදම් සඳහා ප්‍රතිපාදන සැලසිය යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (xxiv) සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රචාරක දැන්වීම් ආයතන 02 කින් ලැබිය යුතු රු.280,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | මෙම මුදල් අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**(ඇ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් විෂයන් 08 ක ශේෂයන් ඒවාට අදාල එම පොත්පත් හා ලේඛනවල ශේෂයන් අතර රු.6,868,478 ක වෙනසකම් පැවතුණි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඈ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.216,400,978 ක් වූ වත්කම් විෂයන් 07 ක් හා රු.7,522,207 ක් වූ වගකීම් විෂයන් 03 ක් සඳහා අවශ්‍ය සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | වටිනාකම (රු.) | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 170අ(2) වගන්තිය | 37,577,588 | හිඟහිටි වරිපනම්, කඩකුලී හා වෙනත් ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ . | නගර සභා ආඥාපනතේ 170අ(2) වගන්තිය ප්‍රකාරව හිඟ වරිපනම් කඩකුලී හා වෙනත් ආදායම් අයකර ගැනීමට කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| | (i) මුදල් රෙගුලාසි 177 | - | තානායමේ එකතු වන මුදල් දිනපතා බැංකුගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | සමහර අවස්ථාවල එසේ කටයුතු කර නොමැති බැවින් මේ සඳහා නිශ්චිත ක්‍රමවේදයක් දැනට සකස් කර ඇත. |
| | (ii) මුදල් රෙගුලාසි 315 | - | තානායමේ දිනපතා එකතුවන මුදල් සඳහා නිසි ආරක්ෂාව ලබාදීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වන විට මුදල් ආරක්ෂිතව තබා ගැනීම සඳහා ලොක් සහිත ලාච්චුවක් හා මේසයක් ලබා දී ඇත. |
| | (iii) මුදල් රෙගුලාසි 571 | 568,029 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මේ සම්බන්ධව ක්‍රියා කිරීමට ක්‍රමවේදයක් සකස් කරමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | වාහන හා යන්ත්‍රෝපකරණ 22 ක ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ක්‍රමවේදයක් සකස් කරනු ලැබේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් පත්‍රය | - | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදිය යුතු ස්ථාන 07 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම ස්ථාන 07 සම්බන්ධව පැන නැගී ඇති ගැටලු අදාල ආයතන සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව බලපත්‍ර ලබාදීමට පියවර ගනු ලැබේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,360,541 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,582,732 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,952,838 ක ශේෂයක් සහිත බැංකු ගිණුම් 02 ක් වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | බැංකු ගිණුම්වලට අදාලව බැංකු සැසඳුම් පිළියෙල කළ යුතු වේ. | ඒ සම්බන්ධව සොයා බලා ඉදිරියේ දී කටයුතු කරමි. |
| (ආ) | වැට් බදු හා මුද්දර ගාස්තු ආදායම් එකතු කර ප්‍රේෂණය කිරීමේ කාර්ය සඳහා මහජන බැංකුවේ පවත්වාගෙන ගිය ජංගම ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,716,314 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගෙවිය යුතු වැට් බදු රු.3,106,386 ක් නිරවුල් කිරීමට ප්‍රමාණවත් නොවීය. | සභාව විසින් ගෙවිය යුතු වැට් බදු නිරවුල් කිරීමට ප්‍රමාණවත් මුදල් තැන්පත් කර බැංකු ගිණුම් පවත්වාගෙන යා යුතු වේ. | මහජන බැංකු ගිණුමේ ඇති මුද්දර ගාස්තු ආදායමෙන් එකතු කරන ලද ප්‍රේෂණ අදාල ආයතනවලට යැවීමට කටයුතු කරනු ලැබේ. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| වරිපනම් හා බදු | 8,872,372 | 10,060,212 | 7,921,052 | 29,268,349 | 8,831,000 | 8,903,372 | 8,377,577 | 27,129,189 |
| කුලී | 8,279,524 | 12,283,369 | 8,163,716 | 7,921,520 | 18,019,880 | 11,441,405 | 11,443,976 | 3,801,867 |
| බලපත්‍ර ගාස්තු | 2,941,958 | 2,941,958 | 2,942,019 | 0 | 1,404,000 | 3,227,021 | 3,227,021 | 0 |
| වෙනත් ආදායම් | 36,730,744 | 4,387,775 | 2,793,635 | 3,877,120 | 29,295,475 | 35,991,983 | 35,619,662 | 1,413,000 |
| | **56,824,598** | **29,673,314** | **21,820,422** | **41,066,989** | **57,550,355** | **59,563,781** | **58,668,236** | **32,344,056** |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2019 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු මුළු ආදායම රු.62,017,349 ක් වූ අතර, වර්ෂය තුළ රු.21,820,422 ක් රැස්කර ගෙන තිබුණි. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 35 ක අවම මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතු වේ. | මේ සඳහා ක්‍රමවේදයක් ඉදිරියේදී යොදා ගැනීමට කටයුතු කරමි. |

### 2.3.3 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාලව අයකර ගත යුතු වරිපනම් බදු රු.29,268,348 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් කඩිනමින් අයකරගත යුතු වේ. | ඉදිරියේදී හිග වරිපනම් අය කර ගැනීමට පනත ප්‍රකාරව කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | සම්මත අතුරු ව්‍යවස්ථා සභාව වැලදගෙන ඇති අතර තවත් අතුරු ව්‍යවස්ථා කිහිපයක් සකස් කරමින් පවතී. |

(ආ) අරමුණු වලින් බැහැර ක්‍රියාකාරකම්
----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රදේශයේ මහජනතාවගේ භාවිතය සඳහා රු.904,676 ක වියදමක් දරා නවීකරණය කරන ලද සේනානායකපුර පුස්තකාල ගොඩනැගිල්ල අදාල අරමුණ සඳහා යොදා නොගෙන විධිමත් ගිවිසුමකින් තොරව සේනානායකපුර සමෘද්ධි සංවර්ධන නිලධාරි කාර්යාලය සඳහා භාවිතා කිරීමට ලබා දී තිබුණි. | පුස්තකාල ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයට යොදාගත යුතු වේ. | තාවකාලිකව සමෘද්ධි සංවර්ධන නිලධාරීනියට රාජකාරි කටයුතුවලට ඉඩ ලබා දී ඇති අතර එය ඉවත් කර ඉදිරියේදී පුස්තකාලයක් දැමීමට කටයුතු යොදනු ලැබේ. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කර ඇති පරිදි නොදිරන කසළ පස් තට්ටුවකින් වැසීමට කටයුතු නොකිරීම හා වර්ගීකරණය කරන ලද නොදිරන අපද්‍රව්‍ය දීර්ඝ කාලයක් එළිමහනේ ගොඩගසා තිබීම යන හේතූන් මත සභාව සතු කොම්පෝස්ට් අංගනයේ පිහිටි සනීපාරක්ෂක බිම් පිරවුම හා නොදිරන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර බලපත්‍ර ලබා දී නොතිබුණි. | මධ්‍යම පරිසර අධිකාරියේ නියමයන්ට අනුව අවශ්‍ය කටයුතු සිදුකර පරිසර බලපත්‍රය ලබාගත යුතු වේ. | මධ්‍යම පරිසර අධිකාරියේ උපදෙස් පරිදි පස් තට්ටු යොදා වැසීම් කළ මුත් නිතර අපද්‍රව්‍ය ගොඩගැසෙමින් පවතින අතර මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍ර ලබා ගැනීමටත් මේ වන විට කටයුතු කර ඇත. රජයේ නීතීරීතිවලට අනුකූලව අපද්‍රව්‍ය අලෙවිය හා ඉවත් කිරීම කල යුතු බැවින් ඒ සඳහා සුලු ප්‍රමාදවීම් සිදුවන බවත් මෙයින් දන්වා සිටිමි. |

| | | |
|---|---|---|
| (ii) අම්පාර සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය විසින් රු.13,750,550 ක වියදමක් දරා ඉදිකර 2018 ජනවාරි 24 දින සභාවට භාර දී තිබුණු මල අපද්‍රව්‍ය ප්‍රතිකර්ම ඒකකය භාවිතයට ගෙන නොතිබුණු අතර, අංගනය වෙත රැගෙන එන මල අපද්‍රව්‍ය පෙර බැහැර කරන ලද යාබද එළිමහන් ස්ථානයටම බැහැර කර තිබුණි. | මල අපද්‍රව්‍ය ප්‍රතිකර්ම ඒකකය භාවිතයට ගත හැකි ලෙස සකස්කර භාවිතයට ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා බල ප්‍රදේශය තුල වෙළඳ ආයතන 02 ක් විසින් ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරු 02 ක් වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.280,000 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වෙළඳ ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු අයකර ගත යුතු වේ. | එක් දැන්වීම් පුවරුවක ගාස්තු සම්බන්ධව විනය පරීක්ෂණයක් සිදුවන අතර, අනෙක් පුවරුවේ ගාස්තුවත් සමඟ ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**(අ) සේවක පුරප්පාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්ය මණ්ඩලයේ තනතුරු 26 ක් සඳහා නිලධාරීන් 58 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුන අතර කළමනාකරණ සහකාර තනතුරේ නිලධාරීන් දෙදෙනෙකුගේ අතිරික්තයක් පැවතුනි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගත යුතු වේ. | ඉදිරියේදී එම සේවකයින් කොන්ත්‍රාත් පදනමට සේවයට ගැනීමටත් අනතුරුව සේවය ස්ථිර කර ගැනීමටත් කටයුතු යොදා ඇති අතර 2019 ස්ථානමාරුවලින් කළමනාකරණ සහකාර නිලධාරීන් 02 වැඩිපුර ලබා දී ඇති අතර මෙවර ස්ථානමාරුවලින් එය නිවැරදි කිරීමටත් කටයුතු කරනු ලැබේ. |

**(ආ) අය නොවී පවතින සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවය අතහැර ගිය සේවකයෙකුගෙන් 2018 වර්ෂයේ සිට අයවිය යුතු රු.130,920 ක මුදල 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | අය නොවී පවතින සේවක ණය අයකරගත යුතු වේ. | දැනට සේවය අතහැර ගිය සේවකයා වරින් වර ශේෂය ගෙවීමට කටයුතු කරනු ලැබේ. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්ගේ අංක 08/1/38 දරන 1985 මාර්තු 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සියලුම ගොඩනැගිලි නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ඉදිකිරීම් රෙගුලාසි වලට අනුකූලව ඉදිකර ඇත්ද යන්න සහ ගොඩනැගිලි භාවිතයට සුදුසු දැයි පරීක්ෂා කර අනුකූලතා සහතිකයක් නිකුත් කළ යුතු වුවද, නගර සභාව විසින් 2016, 2017 හා 2018 වර්ෂවල අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම්පත් 109 ක් අතුරින් සැලසුම්පත් 105 ක් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | 2016, 2017 හා 2018 වර්ෂවල අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම්පත් 105 සඳහා අනුකූලතා සහතික නිකුත් කළ යුතු වේ. | අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා සියලු දෙනා දැනුවත් කර ඇත. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1597 දරන 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අනුකූලතා සහතිකය ලබා නොගෙන ගොඩනැගිල්ලක පදිංචි වූ, භාවිතා කරන හෝ ප්‍රයෝජනයට ගනු ලබන ගොඩනැගිලි සඳහා දිනකට රු.50 ක් බැගින් දඩ මුදලක් අයකර අනුකූලතා සහතිකය නිකුත් කළ යුතු වුවද, නගර සභාව විසින් එසේ සිදුකර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව අනුකූලතා සහතිකය ලබා නොගෙන ගොඩනැගිල්ලක පදිංචි වූ, භාවිතා කරන හෝ ප්‍රයෝජනයට ගනු ලබන ගොඩනැගිලි සඳහා දිනකට රු.50 ක් බැගින් දඩ මුදලක් අයකර ගත යුතු වේ. | දඩ මුදල් අය කිරීම සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ඇ) 2019 වර්ෂයට අදාල අනවසර ඉදිකිරීම් 21 ක් සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුකිරීමට හෝ අදාල ගැසට් පත්‍රය ප්‍රකාරව අයකර ගත යුතු ගාස්තු අයකර ආවරණ අනුමැතිය ලබාදීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට 2020 සැප්තැම්බර් 18 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයට අදාල අනවසර ඉදිකිරීම් 21 සම්බන්ධයෙන් සුදුසු කටයුතු සිදුකළ යුතු වේ. | 2019 වර්ෂයට අදාල අනවසර ඉදිකිරීම් 21 ලෙස සඳහන් කර ඇති අයගෙන් දැනටමත් දෙදෙනෙක් ගොඩනැගිලි අයදුම්පත් භාර දී ඇත. ඉන් තිදෙනෙක් දැනටමත් සැලසුම් අනුමත කරගෙන ඇති අතර ඉතිරි අය සඳහා මේ වන විටත් දැනුවත් කිරීම් කටයුතු කර ඇත. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ධාවනයෙන් ඉවත් කළ රු.8,319,050 ක් වටිනා වාහන 03 ක් දීර්ඝ කාලයක සිට ස්වභාවික උපද්‍රවවලට ලක්වෙමින් සහා භූමියේ තිබුණි. | වත්කම්වලට ආරක්ෂාව සැලසිය යුතු වේ. | අදහස් දක්වා නොමැත |

### 3.5.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් කැබලි 41 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දේපල වල නිත්‍යානුකූල අයිතිය සභාවේ නමට පවරා ගත යුතු වේ. | සභාව සතු ඉඩම් කැබලිවල අයිතිය පවරා ගැනීම සඳහා ඉඩම් කැබලි 18 කට පමණ මේ වන විට මැනුම් නියෝග සඳහා මිනින්දෝරු කාර්යාලයට මුදල් ගෙවා ඇති අතර ඉතිරි ඉඩම් සඳහා ද ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | 1983 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය තුල දී විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙතින් නගර සභාවට ලැබුණු වටිනාකම සඳහන් නොවන වාහන හා යන්ත්‍රෝපකරණ 03 ක් ඇතුළුව රු.35,486,609 ක් වටිනා වාහන හා යන්ත්‍රෝපකරණ 18 ක අයිතිය 2019 වර්ෂය අවසානය වන විටත් පවරාගෙන නොතිබුණි. | වාහන වල නිත්‍යානුකූල අයිතිය සභාවේ නමට පවරා ගත යුතු වේ. | ඉදිරියේදී මේවා පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

### 3.5.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කාය වර්ධන මධ්‍යස්ථානයේ Treadmills යන්ත්‍ර 03 ක් අලුත්වැඩියා සිදුකළ යුතු වීම හේතුවෙන් භාවිතයට ගෙන නොතිබුණි. | යන්ත්‍ර අලුත්වැඩියා කර භාවිතයට ගත යුතු වේ. | සභා අරමුදල් සැලකිල්ලට ගනිමින් මේවා අලුත්වැඩියා කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ආ) 1986 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුල දී නගර සභාවට වරින් වර ලැබුණු රු.4,778,945 ක් වටිනා වාහන හා යන්ත්‍රෝපකරණ 13 ක් වර්ෂ 1½ සිට 15 දක්වා කාල පරාසයක සිට කිසිඳු කාර්යයකට භාවිතා නොකර විවිධ ස්ථානවල ගාල්කර තිබුණි. | වාහන හා යන්ත්‍රෝපකරණ භාවිතායට ගත යුතු වේ. | ඉංජිනේරුවරයාගේ උපදෙස් අනුව ඉදිරියේදී නගර සභාවේ ආදායම් තත්ත්වය සැලකිල්ලට ගෙන නැවත අලුත්වැඩියා කටයුතු කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) වටිනාකම ඉදිරිපත් නොකළ D3K ඩෝසර් කැට් යන්ත්‍රයක් හා රු.32,083,984 ක් වටිනා වාහන හා යන්ත්‍රෝපකරණ 03 ක් 2019 වර්ෂයේ දී යන්ත්‍ර පැය 889 ක් පමණක් භාවිතා කර තිබීම නිසා ඌන උපයෝජිත තත්ත්වයේ පැවතුණි. | යන්ත්‍ර පූර්ණ වශයෙන් භාවිතයට ගත යුතු වේ. | මෙම වාහන 2019 වර්ෂයේදී මීටර් පැය 890 ක් පමණ ධාවනය කර ඇත. |

### 3.5.4 වාහන උපයෝජනය
---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා නගර සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 35 කට ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර වාහන හා යන්ත්‍රෝපකරණ 29 ක් රක්ෂණය කර නොතිබුණි. | සියලු වාහන සඳහා ආදායම් බලපත්‍ර හා රක්ෂණ ආවරණ ලබාගත යුතු වේ. | මෙතෙක් ආදායම් බලපත්‍ර නොමැති වාහන සඳහා ඉදිරියේදී ලබා ගැනීමට කටයුතු කරමි. |

### 3.6 හඳුනාගත් අලාභ
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 05 ක් සඳහා 2019 වර්ෂයට අදාලව ධාවනය කර තිබුණු කිලෝමීටර් 31,597 ක් වෙනුවෙන් වර්තමානයේ සභාව විසින් භාවිතා කරන ඉන්ධන තුලන රේටය අනුව භාවිතා කළ යුතු ඉන්ධන ලීටර ප්‍රමාණය 5,158 ක් වුවද ඒ සඳහා ඉන්ධන ලීටර 5,832 ක් භාවිතා කළ බවට දෛනික ධාවන සටහන් ලියා ඉන්ධන ලීටර 674 ක් අයථා පරිහරණයට යොදාගෙන තිබුණි. වැඩිපුර ලබාගත් ඉන්ධනවල වටිනාකම රු.75,277 ක් විය. | පරීක්ෂණයක් සිදුකර සභා අරමුදලට සිදු වූ පාඩුව ඊට වගකිව යුතු අයවලුන්ගෙන් අයකරගත යුතු වේ. | සොයා බලා මේ සඳහා ඉදිරි පියවර ගනු ලැබේ. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15(1) ප්‍රකාරව 2020 මාර්තු 31 දිනට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු මූල්‍ය ප්‍රකාශන 2020 සැප්තැම්බර් 02 දින ඉදිරිපත් කර තිබුණු අතර, එකී පනතේ 16(2) ප්‍රකාරව නගර සභාව විසින් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යවස්ථාපිතව දක්වා ඇති කාලය තුල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබයි. |